# ශ්‍රී ලංකාවේ පැරණි අයබදු ප්‍රතිපත්තිය පිළිබඳ අභිලේඛනමය සාක්ෂ්‍ය විමර්ශනයක්

ඩබ්ලිව්. එම්. කේ. විජේසුන්දර[1], කේ. ඩබ්ලිව්. එන්. සී. ප්‍රනාන්දු[2]

## හැඳින්වීම

බුදුදහමේ ඉගැන්වෙන ආර්ථික සංකල්ප තුළ මූලික වශයෙන්ම ධනය උපයන පුද්ගලයාට උපදෙස් දී තිබෙන්නේ තමන් උපයන ධනයෙන් 'පංචබලි' යන කොටස් සඳහා ද ධනය වෙන් කළ යුතු බවයි. එහිදී එක් ප්‍රභේදයක් ලෙස 'රාජ බලි' හඳුන්වා දී තිබෙන අතර එහි දී රාජ්‍යයට බදු ගෙවීම පුද්ගලයා සතු යුතුකමක් ලෙස හඳුන්වා දී ඇත. ඒ ආකාරයට ජනතාව යුතුකම් ඉටු කරන විට රටේ පාලකයා සතු ධර්මතාව විය යුත්තේ ධාර්මිකව බදු අය කිරීම බව බෞද්ධ දර්ශනයෙන් පිළිබිඹු වේ.

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පැරණි පාලකයන් තම ජනතාව කෙරෙහි ක්‍රියාත්මක කරන ලද අයබදු ප්‍රතිපත්තිය හා එය බෞද්ධ ආර්ථික දේශපාලන දර්ශනය හා කොතරම් දුරට එකඟ වන්නේද යන්න පිළිබඳ විමර්ශනය කිරීමයි. මෙහි දී ඒ සඳහා ප්‍රමාණ කොට ගනු ලබන්නේ ශ්‍රී ලංකාවේ පැරණි ශිලාලේඛන අතරින් තෝරාගත් ශිලාලේඛන කොටස් කිහිපයකි. එම ශිලාලේඛන පැරණිතම දෘශ්‍යමාන සාක්ෂ්‍ය ලෙස සැලකිය හැකි නිසා පර්යේෂණය තුලනාත්මකව සිදුකිරීම මෙහිදී අභිප්‍රාය වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මේ සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය යොදාගන්නා අතර *Epigraphia Zeylanica* සහ *Inscription of Ceylon* යන ග්‍රන්ථ ප්‍රාථමික මූලාශ්‍රය ලෙසත් මේ පිළිබඳ ලියවී ඇති සෙසු ලිපි සඟරා ද්විතීයික මූලාශ්‍රය ලෙසත් භාවිත කොට ඇත.

## සාකච්ඡාව

දීඝනිකායේ චක්කවත්තිසීහනාද හා කූටදන්ත සූත්‍ර මගින් පිළිබිඹු වන්නේ ආර්ථික ගැටලු හේතුවෙන් සමාජය ආධ්‍යාත්මික හා සදාචාරාත්මක වශයෙන් පරිහානියට පත් වන අතර එයට රාජ්‍යයේ පාලකයාගේ දේශපාලන දර්ශනය ද හේතු වන බව යි. රටවැසියාගේ ආර්ථික සුබසිද්ධිය උදෙසා කටයුතු කිරීමේ මූලික වගකීම හා යුතුකම පාලකයා සතු බවත්, එසේ මග නොසලසන රජ

[1] සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
[2] සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

කෙනෙකුට තම ජනතාවගෙන් අයබදු අය කිරීමට නොහැකි බවත් කූටදන්ත සූත්‍රයේ දැක්වේ.

පන්සිය පනස් ජාතක පොතේ එන ගණ්ඩතින්දු ජාතකයෙන් පවා අවධාරණය වන්නේ අසාධාරණ ලෙස ජනතාවගෙන් බදු අයකරන රාජ්‍ය නිලධාරීන් හේතුවෙන් අයහපත් පාලනයක අමිහිරි ප්‍රතිඵලයන් සමූහයකි. පාලකයා පටු සීමාවන්ගෙන් ඉවත්ව හෝ ආවේග මත තීරණ නොගෙන බුද්ධිමත්ව ක්‍රියාකරන්නෙකු විය යුතුය. පඤ්චාල රජු එසේ නොකිරීමෙන් මහා ව්‍යසනයකට රට පරිවර්තනය විය.

බෞද්ධ දර්ශනය තුළ යහපත් රාජ්‍ය පාලනය පිළිබඳ වන ඉගැන්වීම් අතර දසරාජ ධර්ම, දස සක්විතිවත්, සතර සංග්‍රහ වස්තු ආදී සෑම ප්‍රධාන සිද්ධාන්තයකම අන්තර්ගත දානය යන සංකල්පය යටතට පාලකයා ජනතාව කෙරෙහි ක්‍රියාත්මක කළ යුතු බදු ප්‍රතිපත්තියද අන්තර්ගත වේ. කූටදන්ත සූත්‍රය අනුව රටේ කර්මාන්තකරුවන්ට, ගොවියන්ට, ව්‍යාපාරිකයින්ට, එකී කටයුතු වැඩිදියුණු කිරීම උදෙසා අවැසි ප්‍රාග්ධන ආධාර සපයා අතහිත දීම දානය තුළින් අපේක්ෂා කෙරේ. දුප්පතුන්ට නැගීසිටීමට අත හිත දෙන සමාජ සුබසාධන පද්ධතියක් ගොඩනැඟිය යුතුය. ඒ හරහා අතහිත දිය යුත්තේය. බුදුරදුන් දේශනා කළ පරිද්දෙන්ම බදු ක්‍රියාත්මක කළ යුත්තේ මී මැස්සෙකු මල නොතලා රොන් ගන්නා ආකාරයටය. මෙම අදහසම කෝට්ටේ යුගයේ විසූ රාහුල හිමියන්ගේ කාව්‍යශේඛරයෙහිත්, විදාගම හිමියන්ගේ බුදුගුණාලංකාරය ග්‍රන්ථයේත් අන්තර්ගත වී තිබේ.

අභිලේඛන පොදුවේ ගත් විට ප්‍රයෝජනවත් මෙන් ම වැදගත් මූලාශ්‍රයකි. වංසකතා මෙන් නොව කිසියම් සිද්ධියක් සමකාලීන ව වාර්තා කරන හෙයින් ඒවායේ පක්ෂපාතිත්වයක් දක්නට නොලැබේ. රටක පැරණි සංස්කෘතිය හා ශිෂ්ටාචාරය විදහා දක්වන මූලාශ්‍රයක් වූ අභිලේඛන සඳහා විවිධ ද්‍රව්‍ය භාවිත කර ඇත. මෙම විවිධ අභිලේඛන වර්ග අතුරින් ඉතා වැදගත් වන ගල්වල කරවූ ලේඛන හැඳින්වෙන්නේ සෙල්ලිපි, ශිලාලේඛන *(Inscriptions)* යනුවෙනි. ලංකාවේ ශිලාලේඛන යනු රාජ්‍ය අනුප්‍රාප්තිය, අයබදු ක්‍රම, ඉඩම් භුක්තිය සහ පරිපාලනය පිළිබඳ ඉතා වැදගත් තොරතුරු සපයන මූලාශ්‍රයි.

ශ්‍රී ලංකාවේ පැරණි ආර්ථිකය පිළිබඳ තොරතුරු විශ්ලේෂණයේ දී සාක්ෂි සපයාගැනීමට මුළුමනින් ම ශිලාලේඛන යොදාගත නොහැකි වුව ද එදවස ආර්ථිකයේ ප්‍රධාන අංගය වශයෙන් කෘෂිකර්මය පැවති බවට ඒ පිළිබඳ ප්‍රමාණවත් තරම් තොරතුරු ඇතැම් ශිලාලේඛනවලින් සපයාගත හැකි ය.

අතීතයේ සෑම සමාජ සංවිධානයක ම පාලකයා හා ජනතාව අතර තිබුණේ අත්‍යන්ත බැඳීමකි. රටක් පාලනය කිරීමට ජනතාව කිසියම් දීමනාවක් රජයට ලබාදෙන අතර රජයේ කටයුතු සඳහා ප්‍රධාන වශයෙන් ම ඒ මුදල් යොදාගැනේ. රටක යහපත් පාලනයක් පවත්වාගෙන යාමට අවශ්‍ය ආදායම බොහෝ විට බදු වශයෙන් ද ඇතැම් අවස්ථාවක සේවාවන් වශයෙන් ද ලබාගත් බව සඳහන් වේ. ඊට අමතර ව විදේශ වෙළඳාමෙන් ලැබෙන බදු, කුඹුරු සහ හේන්

ආදියේ ආදායමෙන් අය කළ බදු සහ රජයේ වියදමින් වගා කළ ඉඩම්වලින් ලැබෙන ආදායම රාජ්‍ය වියදම් සඳහා යොදා ගැනුණි.
රජයේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ අය බදු ය. මේ අය බදු මනා ව එක්රැස් කිරීමට රජයට සහාය වීමට සංවිධානය වූ නිලධාරී පැලැන්තියක් වූහ. මොවුන් විසින් මූලික වශයෙන් ම එකී අය බදු එක්රැස් කර භාණ්ඩාගාරයට හෝ ප්‍රාදේශීය සභාවලට යැවීම කරන ලදී. විහාරාරාම සහ දේවාල සතු ඉඩකඩම් ද ඇතැම් භික්ෂූන් වහන්සේට සහ ප්‍රභූවරුන්ට ලැබුණ දේපළ ද වාර්ෂික ව අයබදුවලින් නිදහස් ව පවරා දී ඇත. එහෙයින් විහාරාරාම සහ දේවාලවල ඉඩම්වලට ලැබුණ විශේෂ වරප්‍රසාද ලෙස මෙම බදු අය නොකිරීම දැක්විය හැකි ය.
එකල රජවරුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ ධාන්‍ය බද්ද/ඉඩම් බද්දයි. මුල්කාලීන සෙල්ලිපි බොහොමයක මෙම ඉඩම් බදු පිළිබඳ තොරතුරු හමුවේ. බොජකපති, බොජියපති, බොජිපති, බෙජිපති, බෙජිපෙත යනාදී වශයෙන් විවිධාකාරයෙන් ඉඩම් බදු හඳුන්වා ඇත. සුමංගල ශබ්දකෝෂයේ මෙය ආදායම යනුවෙන් දැක්වේ. මෙම බද්ද විවිධ ප්‍රමාණවලින් අය කරගත් බවට තොරතුරු හමුවේ. සෑම කුඹුරකින් ම සමාන අයබද්දක් ගෙන නැත. වැව් ආසන්න සරුසාර කුඹුරුවලින් වැඩි අය බද්දක් ද නිසරු දිය හිඟ කුඹුරුවලින් අඩු බද්දක් ද අය කර ඇත්තේ ය. මේ නිසා නිෂ්පාදකයාට ලැබුණු සහනය සුළුපටු නොවේ. සරු කුඹුරුවලින් වැඩි බද්දකුත් නිසරු කුඹුරුවලින් අඩු බද්දකුත් ගත් අතර ගොවියා දුකට පත්කර ඔවුන් විසින් නිෂ්පාදනය කරන ලද සියල්ල ම බදු වශයෙන් අය කිරීම එදා සිරිත නොවී ය. මෙය සටහනක් මඟින් මෙසේ දැක්විය හැකි ය.

| යෙදූ ප්‍රමාණය | අය බද්ද | | |
|---|---|---|---|
| සරු කුඹුරු ඃ- | අමුණු | පැල් | මඩරන් |
| අමුණු 1 | 1යි | 3යි | 6යි |
| තරමක් සරු කුඹුරුඃ- | | | |
| අමුණු | 1යි | 2යි | 4යි |
| නිසරු කුඹුරු ඃ- | 1යි | 1යි | 4යි |

(විමලවංස හිමි, 1959:141)

දකපති, බොජකපති නොහොත් බොජියපති යන පද සෙල්ලිපි ව්‍යවහාරයෙහි දක්නට ලැබෙන්නේ ක්‍රිස්තුවර්ෂ හය සහ හත සියවස් දක්වා පමණි.

රජයේ කටයුතු සඳහා ප්‍රධාන වශයෙන් මුදල් ලබා ගත්තේ අයබදුවලිනි. සමහර රජවරු ජනතාවගෙන් විශාල ලෙස බදු අය කළ අතර සමහර රජවරු ඇතැම් බදු අත්හැර තිබේ. නිශ්ශංකමල්ල වැනි රජවරු එසේ බදු අත්හැර ඇති බවට ශිලා ලේඛන සාක්ෂ්‍ය දරයි.
''අවුරුදු ගණනකට අය හැර වදාරා තුන් රජහිම හැම කලට කැති අද හැරැ වදාරා...'' (රුවන්වැලි සෑ ලිපිය ) (විමලවංස හිමි, 1959:139)

''පෙරැ රජුන් නො මද අය ගෙනැ දුස්ථ කළ ලංකා වාසීන්ට පස් අවුරුද් දෙක අය හැර...'' (පොළොන්නරු හැටදාගේ ලිපිය ) (විමලවංස හිමි, 1959:139)

''ඇත්වෙහෙරැ බද් තුවාක් ගම්බිමින් තුමනට් දුන් දසකැර මුත් වැසර් පැත්පමුණු නොගන්නා ඉසා...'' (පස්වන කසුප් රජුගේ අනුරාධපුර පුවරු ලිපිය) (රණවැල්ල, 2014:103)

මානව ශාස්ත්‍ර ධර්මයට අනුව ගොවියා තම අස්වැන්නෙන් හයෙන් පංගුවක් බදු ලෙස ගෙවිය යුතු වන අතර උක්ත ලිපියෙන් කියවෙන පරිදි අනුරාධපුර යුගයේ අවසාන භාගයේදී ගොවින් ඇතැම්විට තම අස්වැන්නෙන් දහයෙන් පංගුවක් ධාන්‍ය වශයෙන් ගෙවා තිබේ.

''දුකින් කරන සෙහෙන් කටුසර අය හැම කලටම නො ගන්නා නියායෙන් හා ව්‍යවස්ථා කොටැ...'' (ගල්පොත ලිපිය) (විමලවංස හිමි, 1959:139)

කටුසර බෝග දුකසේ වගා කරන නිසා බදු නොගන්නා බව ආදී වශයෙන් ලිහිල් බදු ප්‍රතිපත්තියක් එකල බෞද්ධ රජවරු ක්‍රියාත්මක කර තිබෙන බව පැහැදිලි වේ. ඒ අනුව පැහැදිලි වන්නේ එකල බොහෝ රජවරු ජනතාව මත ලිහිල් බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර තිබෙන බවයි.

## නිගමනය

එකල රජයට ආදායම් ලැබුණ ආකාර බොහෝය. දිය බදු, කුඹුරු බදු, හේන් බදු, මල බදු යනාදී වශයෙන් විවිධ ආකාරයේ බදු අයකිරීම් පිළිබඳ අදහස් වේ. මීට අමතර ව ථූපාරාම පුවරු ලිපිය, කොණ්ඩවට්ටාන් ලිපිය වැනි තවත් ලිපි විමර්ශනයේ දී පෙනී යන්නේ එකල රජවරු බොහෝ විට තම බදු ප්‍රතිපත්තිය බෞද්ධ දර්ශනයේ සම්මත විධි නියාමවලට අනුව ක්‍රියාත්මක කළ බවයි.

ඒ අනුව මෙම පර්යේෂණයේ දී නිගමනය කළ හැක්කේ අතීතයේ බෞද්ධ පාලකයන්ගෙන් බහුතරයක් මල නොතලා රොන් ගන්නා මී මැස්සෙකු මෙන් රාජ්‍ය පාලකයා ජනතාව නොරිදවා බදු අය කරගැනීම යහපත්ය යන බෞද්ධ ආර්ථික දර්ශනයේ සංකල්ප අනුව තම ජනතාව කෙරෙහි යහපත් බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කොට ඇති බව යි. ඒ බවට මෙහි දක්වන ලද ශිලාලේඛන කිහිපය මෙන් ම තවත් බොහෝ ශිලාලේඛන සාක්ෂ්‍ය සපයයි.

## ආශ්‍රිත ග්‍රන්ථ


*Epigraphia Zeylanica. vol 1-4*

*Inscription of Ceylon. vol 1-2*

අමරවංශ හිමි, කොත්මලේ. (1969). *ලක්දිව සෙල්ලිපි.* කොළඹ: එම්.ඩී. ගුණසේන සහ සමාගම

විමලවංශ හිමි, බද්දේගම. (1959). *සෙල්ලිපි සමාජය.* කොළඹ: අනුල මුද්‍රණාලය